# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 27 දරන
# දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 සැප්තැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1986 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 05 වන දින.]

එල්. ඩී.—ඕ. 12/86

## 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1986 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

2. (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — *1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ඒ ඡේදයේ (XLVIII) වන අනුඡේදයේ " මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව.". යන වචන වෙනුවට " මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදය අගට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (XLIX) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදල.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ඒ වගන්තියේ (ණ) ඡේදයෙහි " තැනැත්තකුට උද්ගත වන ලාභ සහ ආදායම." යන වචන වෙනුවට " තැනැත්තකුට උද්ගත වන ලාභ සහ ආදායම ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (ත) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක්.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (ණ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.*

" (ණණ) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලට ;".

2—ඒ 090525—7,475 (86/05)

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "ආණ්ඩුවට හෝ යම් පළාත් පාලන ආයතනයකට" යන වචන වෙනුවට "ආණ්ඩුවට හෝ 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලට හෝ යම් පළාත් පාලන ආයතනයකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අතීතයට බලපෑම.

6. මේ පනතේ 2 වන, 3 වන, 4 වන සහ 5 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.